රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2018

මගේ අංකය : EST-6/03/LEA/3160
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 16:2 හා 16:2:1 උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමටත්, 16:2:2 සිට 16:2:4 දක්වා නව උප වගන්ති ඇතුළත් කිරීමටත් 2018.08.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

16:2 පිළිගත් ආයතනයක නිත්‍ය පාඨමාලාවක් හැදෑරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත පහත කොන්දේසිවලට යටත්ව රාජ්‍ය නිලධරයකුට වැටුප් රහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා දිය හැකිය.

16:2:1 පරිවාසය පිට සිටින නිලධරයකුගේ පරිවාස කාලය විදේශ අධ්‍යයනයට ගත වන කාලයට සමාන කාලසීමාවකින් දීර්ඝ කිරීම.

16:2:2 අධ්‍යයනය ලබන නිලධරයාගේ කලත්‍රයා ද රාජ්‍ය සේවයේ නියුතු අයෙක් වන්නේ නම් කලත්‍රයාට මෙහි 16:1:9 හා 16:1:10 උප වගන්තීන්වලට යටත්ව වැටුප් රහිත නිවාඩු ලබා දීම.

16:2:3 මේ යටතේ අධ්‍යයන නිවාඩු ලබා ගන්නා නිලධරයකු මෙහි 16:15 උප වගන්තිය අනුව නියම වන අනිවාර්ය සේවා කාලයෙන් නිවාඩු නිර්දේශය ලබා දෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරනු ලබන කාලසීමාවක් එම දෙපාර්තමේන්තුව තුළම සේවය කර සම්පූර්ණ කළ යුතුය. එතෙකුදු වුවත්, මෙම කොන්දේසිය රාජ්‍ය සේවයේම තවත් සේවාවක් සඳහා මුදා හැරීම වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා අදාළ කර නොගත යුතුය.

16:2:4 විදේශ අධ්‍යයන සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමේ දී සඳහන් වන 16 වගන්තියේ අනෙකුත් කොන්දේසි සියල්ලක්ම 16:2 උප වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන විට ද අදාළ වනු ඇත.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය